# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2454/61 - 2025 සැප්තැම්බර් මස 20 වැනි සෙනසුරාදා - 2025.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය - IR/COM/02/2020/158

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.12.04 දිනැති හා අංක 2361/02 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දංකොටුව,බටහිර කටුකෙන්ද, අංක 68 හි පදිංචි ආර්. පී. කේ. රංජනී මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, මෝදර පිහිටි ලංකා ධීවර සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/84/2023 හා 2025.08.14 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A - G 045415 - 11 (2025/09)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.**

ආරාවුල් අංකය - IR/COM/02/2020/158
බේරුම්කරණ අංකය - A/84/2023

ආර්. පී. කේ. රංජනී මිය,
අංක 68,
බටහිර කටුකෙන්ද,
දංකොටුව

*පළමු පාර්ශ්වය*

සහ

ලංකා ධීවර සංස්ථාව,
මෝදර,
කොළඹ 15.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල
පෙනී සිටීම.

පළමු පාර්ශ්වය වෙනුවෙන් : නියෝජිත එම්. කේ. හේමපාල මයා

දෙවන පාර්ශ්වය වෙනුවෙන් : නීතිඥ ඔෂිනි සේනාධිපති මෙනවිය සමග ආයතනය වෙනුවෙන් නීති නිලධාරී රුසිරු සම්පත් මහතා සහ වැඩ බලන මානව සම්පත් කළමනාකාරිනී චමරි මනුප්‍රිය මහත්මිය

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුගේ අංක IR/COM/02/2020/158 හා 2023 .11.07 දිනැති ලිපියෙන් ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු පහත පරිදි වාර්තා කර ඇත.

"ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

ලංකා ධීවර සංස්ථාවේ සේවය කළ ආර්. පී. කේ. රංජනී මහත්මිය වෙත MM 1-1 සේවා ගණයේ කළමනාකාර I ශ්‍රේණිය ලබා නොදීමෙන් ඇයට අසාධාරණයක් සිදුවී තිබේද? එසේ තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න වේ."

ඉල්ලුම්කාරිය වන ආර්. පී. කේ. රංජනී මහත්මිය කොන්ත්‍රාත් පදනම මත ලිපිකාරිණියක ලෙස ලංකා ධීවර සංස්ථාවේ සේවයට බඳවාගෙන ඇත්තේ 1984.08.13 දින සිටය. 1988.10.01 දින ඇයගේ සේවය ස්ථිර කර ඇත. 1996.01.01 දින III ශ්‍රේණියේ ලිපිකාර තනතුරට උසස් කර ඇත. පසුව ඇයගේ අභියාචනය සලකා බලා ඇයගේ පත්වීම II ශ්‍රේණියේ ලිපිකාර තනතුර ලෙස සංශෝධනය කර ඇත. 2002.08.01 දින සිට ලිපිකරු (විශේෂ ශ්‍රේණිය) වශයෙන් උසස්වීමක් ලබා ඇත. 2006 වසරේ උසස්වීමක් සඳහා අයදුම්කළ නමුත් ලිපිකරු (විශේෂ ශ්‍රේණිය) තනතුරේ වසර පහක් සපුරා නොතිබූ බැවින් iv A ශ්‍රේණියේ කළමනාකාර තනතුර හිමි නොවිය. පසුව 2011.10.03 දින iv A ශ්‍රේණියේ කළමනාකාර තනතුර ලබා දෙන ලදි. නමුත් වැටුප් වර්ධක නිසිපරිදි ගලපා නොතිබීම පිළිබඳව අභියාචනයක් ඉදිරිපත් කොට වැටුප් විෂමතාවය නිවැරදි කර ගැනීමට සිදු විය. පසුව කළමනාකාර සේවා ව්‍යවස්ථාලේඛ අංක 20 යටතේ 2012.03.14 දින සිට කළමනාකරණ III ශ්‍රේණිය හිමිවිය. පසුව ඇයට වඩා අඩු සේවා කාලයක් හා පහළ ශ්‍රේණිවල සේවය කළ අයවලුන්ට වැඩි වැටුප් ලබාදීම නිසා මතු වූ වැටුප් විෂමතාවය නිරවුල් කර දෙන ලෙස 2015.03.03 දින සභාපතිතුමාට ඉල්ලීමක් කරන ලද නමුත් එයට සාර්ථක පිළිතුරක් ලැබී නැත.

2016.12.14 දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ගේ වාචික හා ලිඛිත නියමයන් අනුව ඇය දරමින් සිටි රාජකාරිවලට අමතරව ගණකාධිකාරී (ගෙවීම්) තනතුරට අයත් රාජකාරි වගකීම් ද ඇය විසින් ඉටුකරන ලද බව කියා සිටී. ඇයට බලපා තිබූ

වැටුප් විෂමතාවය හා පළමු ශ්‍රේණියට උසස්වීමක් ලබාගැනීම සඳහා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාට අභියාචනයක් 2019.07.10 දින ඉදිරිපත් කරන ලද බවත් අමාත්‍යතුමා විසින් "අවශ්‍ය කටයුතු කර ඉක්මනින් මා හට දන්වන්න" යන සටහන යොදා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මා.ස) භාරදෙන ලද නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගත් බවත් කියයි. එම ඉල්ලීම්වලට සාධාරණ පිළිතුරක් නොලද නිසා බේරුම්කරණයට යොමුවූ බවත් කියයි. ඒ අනුව ඇය ඉල්ලා සිටින්නේ වසර 36ක සංස්ථා රාජකාරි ඉතිහාසය තුළ කාර්ය සාධනය හා කාර්යක්ෂමතාවයන් මනාව පවත්වා ගනිමින් ඉහළ කළමනාකාරීත්වයේ විධානයන්ට ගරු කරමින් කළමනාකරණ සේවයට අයත් MM I ශ්‍රේණියේ රාජකාරි වගකීම් ඉටුකළ 2017 ජනවාරි සිට 2020 ජනවාරි දක්වා කාලයට අදාළ එකී MM I ශ්‍රේණියේ පිහිටුවා පසු වැටුප් ලබාදෙන ලෙසට ප්‍රදානයක් ලබා දෙන ලෙසය.

දෙවන පාර්ශ්වයේ කරුණු දැක්වීම පහත පරිදි වේ. ඉල්ලුම්කාරිය මේ වන විටත් වගඋත්තරකාර සංස්ථාවෙන් විශ්‍රාම ගොස් ඇති බවත්, මෙම නඩුව ආරම්භ කරන අවස්ථාවේදී සේවක-සේවායෝජක ගිවිසුමක් නොපැවති බැවින් මෙම නඩුවේ පාර්ශ්වයන් අතර සජීවී ආරාවුලක් (Live Dispute) නොපවතින බවයි. ඒ අනුව ඇය විසින් අයැද ඇති සහනයන් ලබාදීමට ගරු බේරුම්කරණ අධිකරණයට බලයක් නොමැති බවයි.

කෙසේ වෙතත් දෙපාර්ශ්වයේම එකඟතාවය අනුව බේරුම්කරණ විභාගය පවත්වන ලදී.

1984.08.14 දින සිට ගිණුම් ලිපිකරු තනතුරට කොන්ත්‍රාත් පදනම යටතේ සේවයට බඳවා ගත් අයදුම්කාරිය 1988.10.01 දින සිට සේවයේ ස්ථිර කරන ලද බවත් එතැන් සිට ඉල්ලුම්කාරිය විසින් දක්වා ඇති පරිදි උසස්වීම් හා වැටුප් වර්ධක ලබා දී ඇති බවත් ප්‍රකාශ කරයි. පළමු පාර්ශ්වය විසින් සංස්ථාවේ කළමනාකාරීත්වයට කරන ලද අභියාචනය සලකා බලා 2021.03.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඇයට කළමනාකාර III ශ්‍රේණියට (කණිෂ්ඨ කළමනාකාර) උසස් කර ඇති බව කියයි. එම උසස්වීම ලබාදීමේදී පළමු පාර්ශ්වය JM I-I සේවා ගණයට අයත් වැටුප් පරිමානයේ තුන්වන පියවරෙහි පිහිටුවා ඇත. කිසිදු අවස්ථාවකදී රංජනී මහත්මියට MM I-I සේවා ගණයේ ගණකාධිකාරි තනතුරට අදාළ වැඩ බැලීමේ පත්වීමක් ලබා දී නැත. 2016.12.14 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) විසින් පවරා ඇත්තේ JM I-I සේවා ගණයට අයත් ගිණුම් නිලධාරී ගෙවීම් තනතුරට අදාළ රාජකාරි වේ. එම රාජකාරි ඇයගේ නිත්‍ය තනතුර වන කළමනාකාර III ශ්‍රේණියට අදාළ රාජකාරි තුළ අන්තර්ගත රාජකාරි වේ.

පළමු පාර්ශ්වය විසින් 2019.07.10 දින කළමනාකාර I ශ්‍රේණියට උසස්වීමක් ලබාදෙන ලෙස ඉල්ලා, අමාත්‍යතුමා වෙත යොමු කරන ලද ලිපියේ යොදා ඇති සටහන්වලින් කියවෙන්නේ කිසිදු සොයා බැලීමකින් තොරව ඇයගේ ඉල්ලීම ඉටුකර දෙන ලෙස නොවන බවත් එම සටහන ප්‍රකාරව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මානව සම්පත් රංජනී මහත්මියගේ සේවා වාර්තාවන් ලබාගෙන එම වාර්තාව සභාපතිතුමා වෙත 2019.10.22 දින යොමු කර ඇති බවත් කියා සිටී. එම සේවා වාර්තාව අනුව කළමනාකාර I ශ්‍රේණියට උසස්වීමක් ලබාදීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නැත.ඒ වන විටත් ඇය කළමනාකාර III ශ්‍රේණියේ සිටි බැවින් ඇය කළමනාකාර II ශ්‍රේණියේ උසස්වීමද ලබා ගෙන නොතිබීම සහ ඇය විසින් ඉල්ලුම්කර ඇති තනතුරේ සේවක පුරප්පාඩුවක් නොමැතිවීම යන හේතූන් නිසා ඇයගේ ඉල්ලීම අනුමත නොකරන ලද බව කියා සිටී.

එමෙන්ම, MM I-I සේවා ගණයේ ගණකාධිකාරී තනතුරට අදාළ සුදුසුකම් ඉල්ලුම්කාරියට නොමැති බැවින් එම තනතුර ඇයට ලබාදීමට බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව කිසිදු හැකියාවක් නොමැති බව කියා සිටී.

2016.09.14 දින මුදල් කළමනාකාර තනතුර සඳහා ඒ. ජේ. චින්තා කුමුදිනී මහත්මිය පත් කර ඇති අතර ඇය 2020.07.31 දින දක්වා එම තනතුරේ සිටි බැවින් පළමු පාර්ශ්වයේ රංජනී මහත්මිය විශ්‍රාම යන විටත් සංස්ථාවේ MM I-I තනතුරේ පුරප්පාඩුවක් තිබී නොමැති බවද කියා සිටී. පළමු පාර්ශ්වය කිසිදු අවස්ථාවක ඉල්ලුම්කාරියට අයුක්ති සහගතව හෝ අසාධාරණ ලෙස කටයුතු කර නොමැති අතර සෑම විටම සද්භාවයෙන් යුතුව සානුකම්පිතව කටයුතු කර ඇති බවද කියා සිටී. ඒ අනුව ඇය විසින් කර ඇති ඉල්ලීම නිශ්ප්‍රභ කරන ලෙසද ඉල්ලා සිටී.

පළමු පාර්ශ්වය වෙනුවෙන් ආර්. පී. කේ. රංජනී මහත්මිය සාක්ෂි ලබාදෙන ලදි. තමන් 1980.08.14 දින කොන්ත්‍රාත් පදනම මත සේවයට බැඳී ලිපිකාරිනියක් ලෙස සේවය කර 1988.10.31 දින ස්ථිර පත්වීමක් ලබා ගෙන ඇත. පත්වීම් ලිපියේ ලිපිකරු ලෙස සඳහන් වන නමුත් තමන් ගිණුම් ලිපිකරු ලෙස සේවය කළ බව කියයි. විශේෂ ව්‍යාපෘතියක වසර 11ක් සේවය කර ඇත. 1996.01.01 දින සිට 3 ශ්‍රේණියේ ලිපිකරු තනතුර ලැබුණා. අභියාචනා කමිටු තීරණයක් අනුව 1996.01.01 දින සිට 2 ශ්‍රේණියේ ලිපිකරු තනතුර ලැබුණා. 2002.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියේ ලිපිකරු තනතුරකට උසස්වීමක් ලැබුණා. 2011.10.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකාර IV-A ශ්‍රේණියට උසස්වීමක් ලැබුණා. 2012.03.20 දින සිට කළමනාකාර III ශ්‍රේණියට උසස්වීමක් ලැබුණා. මගේ වැටුප් විෂමතාවය පිළිබඳව ඉදිරිපත් කරන ලද ඉල්ලීමට මට සාධාරණ පිළිතුරක් ලැබුණේ නැහැ. මට ගෙවීම් අංශයේ ලිපිගොනු විශාල ප්‍රමාණයක් භාර දුන්නා. මට සිදුවී ඇති අසාධාරණය පිළිබඳව මම ඇමතිතුමාට අභියාචනයක් 2019.01.07 දින ඉදිරිපත් කළා. ඒ ලිපියෙන් කරන ලද ඉල්ලීම වුනේ මට කළමනාකාර I ශ්‍රේණියට උසස්වීමක් ලබාදෙන ලෙසයි. මානව සම්පත් කළමනාකරු මට දැනුම් දුන්නා. එම ඉල්ලීම ඉටුකළ නොහැකි බව. ගණකාධිකාරිවරුන් විශ්‍රාම ගිය පසු මට ඒ රාජකාරි කරන ලෙස වාචිකව දැනුම් දුන්නා. ඒ වෙනුවෙන් කිසිම දීමනාවක් ගෙව්වේ නැහැ. අවසාන වශයෙන් මම ඉල්ලා සිටින්නේ I ශ්‍රේණියේ කළමනාකාර තනතුර ලබා දෙන ලෙසයි.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් වැඩ බලන මානව සම්පත් කළමනාකර මුනසිංහ ජයවර්ධන විදානපතිරණගේ චමරි මනුප්‍රියාගේ සාක්ෂිය ලබා දෙන ලදි. ඉල්ලුම්කාර රංජනී මහත්මිය ලිපිකාරිනියක් ලෙස 1984.08.14 වැනි දින කොන්ත්‍රාත් පදනමින්

සේවයට බැදී 1988.01.01 දින සේවයේ ස්ථිර කර තිබෙනවා. පසුව ගිණුම් ලිපිකරු ලෙස තනතුරු නාමය වෙනස් කර තිබෙනවා. ඇයට වරින්වර උසස්වීම් ලැබී තිබෙන අතර අභියාචනා මණ්ඩල මගින්ද උසස්වීම් ලබා දී තිබෙනවා. 2012.03.14 දින සිට ඇයට කළමනාකරණ III ශ්‍රේණියට උසස්වීමක් ලැබෙනවා. එය JM I-I වැටුප් කේතයට අයත් තනතුරක්. 2016 වසරේදී ස්වේච්ඡා විශ්‍රාම වන්දි ක්‍රමය ක්‍රියාත්මක වීමේදී ගණකාධිකාරිවරුන් තිදෙනාම සේවයෙන් ඉවත්ව ගියා. කවදාක හෝ ඉල්ලුම්කාරියට ගණකාධිකාරී තනතුරේ ආවරණ පත්වීමක් හෝ වැඩබලන පත්වීමක් ලබා දී නැත සංස්ථාවේ 2019 අනුමත කාර්ය මණ්ඩලය අනුව ගණකාධිකාරී තනතුර වෙනුවට MM I-I ගණයේ ජොෂ්ඨ කළමනාකාර (මුදල්)තනතුර අනුමත වෙනවා. ඒ අවස්ථාවේදී ජොෂ්ඨ කළමනාකාර (මුදල්) තනතුරේ වැඩ බැලීම සඳහා කෙනෙකු පත් කළා. එසේ වැඩ බැලීම සඳහා පත් කළේ චින්තා කුමුදිනී මහත්මියයි. වැඩ බලන ගිණුම් නිලධාරි ලක්ෂිත සිල්වාළඟ තිබූ ලිපිගොනු ඔහුගේම තනතුරට සමාන්තර ශ්‍රේණියක සිටි පැමිණිලිකාරියට භාරදී තිබෙනවා. රංජනී මහත්මිය 2019.07.10 දාතමින් යුතු ලිපිය මගින් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා ඇත්තේ ඇයට කළමනාකරණ I ශ්‍රේණිය ලබා දෙන ලෙසයි.

පැමිණිලිකාරිය 2020.01.11 දින විශ්‍රාම යන විට සිටියේ කළමනාකාර III ශ්‍රේණියේයි. පැමිණිලිකාරියට ජොෂ්ඨ කළමනාකාර (මුදල්) තනතුරට පත්වීමට අවශ්‍ය සුදුසුකම් තිබුණේ නැහැ. ජොෂ්ඨ කළමනාකාර (මුදල්) තනතුරට පත්වීමට සුදුසුකම් ලබන්නේ කළමනාකාර I ශ්‍රේණියේ වසර පහක් සේවය කල විටදීයි. ඇයට වැඩබැලීමේ තනතුරක් මානව සම්පත් අංශයෙන් ලිඛිතව ලබා දී නැහැ. වැඩ බැලීමේ පත්වීම් ලබාදීම වාචිකව කළ නොහැකියි. වැඩ බැලීමේ පත්වීමක් ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ද ලබා ගත යුතුයි.

මෙම සියලු කරුණු සලකා බැලීමේදි පෙනීයන්නේ 1984.08.14 දින කොන්ත්‍රාත් පදනම මත ලිපිකාරිනියක ලෙස ධීවර සංස්ථාවේ සේවයට බැඳුන ඉල්ලුම්කාර පළමු පාර්ශ්වයට 1988.10.01 දින සිට ස්ථිර පත්වීමක් ලබා දී ඇති අතර වරින් වර සංස්ථා සේවකයන්ට පොදුවේ උසස්වීම් ලබා දෙන අවස්ථාවන්හි දී ද ඇය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනාවන් සලකා බැලීමෙන් පසුවද උසස්වීම් ලබාදී ඇති බවයි. අවසන්වරට 2012.03.14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි III ශ්‍රේණියේ කළමනාකාර තනතුරට උසස්වීමක් ලබා දී ඇත්තේ ඇය විසින් කරන ලද ඉල්ලීමක් සැලකිල්ලට ගනිමිනි. ඊට පෙර ඇයට 2011.10.03 දින IV-A ශ්‍රේණියේ කළමනාකාර තනතුරකට උසස්වීමක් ලබා දී ඇති අතර නැවත 2011.10.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් වර්ධක 4ක ප්‍රදානයක් ද ලබා දී ඇත. ඇය ප්‍රකාශ කර සිටින්නේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ගේ වාචික හා ලිඛිත නියමයන් පරිදි ඇය දරමින් සිටි රාජකාරිවලට අමතරව ගෙවීම් අංශය භාර ගණකාධිකාරී (ගෙවීම්) තනතුරට අයත් රාජකාරි වගකීම් 2016.12.14 දින සිට ඇය වෙත පවරන ලද බවයි. ගණකාධිකාරී (ගෙවීම්) තනතුරට අයත් රාජකාරි යනු භාරධූර වගකීම් සහිත රාජකාරියක් වන බැවින් විධිමත් ලිඛිත බලතල පැවරීමකින් තොරව කළ හැකි රාජකාරියක් නොවේ. එවැනි ලිඛිත බලතල පැවරීමක් සිදුකර නොමැති අතර ගණකාධිකාරී (ගෙවීම්) තනතුරට අයත් රාජකාරී ඇය විසින් ඉටුකරන ලද බවක් ද පැහැදිලි නොවේ. පැමිණිලිකාරිය 2019.07.10 දාතමින් යුතුව අමාත්‍යවරයාගෙන් ඉල්ලීමක් කර ඇත්තේ "2016 දෙසැම්බර් මස සිට කළමණාකාර 1 ශ්‍රේණිය දක්වා උසස්වීමක් හා හිඟ වැටුප්" ලබාදෙන ලෙසය. ඇය බේරුම්කරණ විභාගයේදී සාක්ෂි ලබාදෙමින් (2023.06.28 සටහන් 17 පිටුව) මෙසේ ප්‍රකාශ කරයි.

"ප්‍රශ්නය - අවසාන වශයෙන් තමුන් මෙම අධිකරණයෙන් ඉල්ලා සිටින සහන මොනවාද? පිළිතුර - 2015 වසරේ කාන්ති චමිල් මහත්මිය 1 ශ්‍රේණියේ කළමනාකාරිනියක් වශයෙන් විශ්‍රාම ගියා. එයා ඉන්න කාලයේම මට දෙවන ශ්‍රේණියේ කළමනාකාර ලබාගන්න අභියාචනයක් ඉදිරිපත් කළා. නමුත් මට සහනය ලැබුණේ නැහැ. ඇය 2015.10.01 දින විශ්‍රාම ගියා. ඇය හා සමාන රාජකාරි තනතුරක්, සේවා කාලයක් තියෙන නිසා 1 ශ්‍රේණියේ කළමනාකාර තනතුර ඉල්ලා සිටිනවා"

ඇයගේ මූලික සාක්ෂියේ දී MM I-I සේවා ගණයේ ගණකාධිකාරී තනතුරක් ඉල්ලා සිටියේද නැත.

ඇය MM I-I සේවා ගණයේ ගණකාධිකාරී තනතුරක් සඳහා ඉල්ලීමක් සංස්ථා බලධාරීන් වෙත ඉදිරිපත් කරන ලද බවක් ඇයගේ විස්තර ප්‍රකාශයේ සඳහන් නොවේ. එහෙත් කාර්මික අධිකරණයට ඉදිරිපත් කර ඇති ඉල්ලීමේ MM I-I සේවා ගණයේ සේවයේ පිහිටුවා පසු වැටුප් ලබාගැනීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා ඇත.

ධීවර සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩල ව්‍යුහය අනුව අදාළ කාලය තුළ මුදල් අංශය සඳහා MM I-I සේවා ගණයේ තනතුරු තුනක් අනුමතව තිබිණි. එම තනතුරු සඳහා නිලධාරීන් පත් කර සිටි බව වාර්තා විය. ඒ අනුව MM I-I සේවා ගණයේ තනතුරු ඇබෑර්තු තිබුනේද නැත.

අයදුම්කාරිය මේ වන විට දරමින් සිටියේ III ශ්‍රේණියේ කළමනාකාර තනතුරකි. ඇයගේ සාක්ෂියේදී ප්‍රකාශ කර සිටියේ II ශ්‍රේණියට හා I ශ්‍රේණියට උසස් කරන ලෙස අයදුම් කරන ලද නමුත් එම අවස්ථා නොලැබුණ බවයි.

අනුමත බඳවාගැනීමේ පටිපාටිය අනුව MM I-I සේවා ගණයේ තනතුරක් සඳහා අභ්‍යන්තර අයදුම්කරුවකු සපුරාලිය යුතු සුදුසුකම් මෙසේය.

"Being an employee in Junior Manager Category with a minimum of five (05) years satisfactory service in Grade I relevant to the field of Accounting/Finance in a permanent post"

ඒ අනුව ඇය JM I-I වැටුප් කේතයට අයත් තනතුරක 1 ශ්‍රේණියේ නිලධාරිනියක් ලෙස වසර 05ක් සේවය සපුරා නැති හෙයින් MM I-I සේවා ගණයේ කළමනාකාර තනතුරක් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නැත.

මේ අනුව ලංකා ධීවර සංස්ථාවේ සේවය කළ ආර්. පී. කේ. රංජනී මහත්මිය වෙත MM I-I සේවා ගණයේ කළමනාකාර 1 ශ්‍රේණිය ලබා නොදීමෙන් ඇයට අසාධාරණයක් සිදුවී නැති බව තීරණය කරමි.

මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්තිසහගත ප්‍රදානයක් බව සහතික කරමි.

**නීතිඥ ආර්. ඒ. තිලකරත්න,**
බේරුම්කරු,

2025 අගෝස්තු මස 14 වැනි දින දීය.

EOG 09 - 0196